# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:


## තුන්වන කාර්තුවේ ඇරඹුමත් සමඟ, නිෂ්පාදන අංශයෙහි වර්ධනය ආන්තික පහත වැටීමක් පෙන්නුම් කරයි

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2018 ජුනි මස වාර්තා කළ 57.6 ක අගයට සාපේක්ෂව 2018 ජූලි මාසයේ දී 57.2 ක දර්ශක අගයක් දක්වා අඩු විය. මෙම ආන්තික පහත වැටීම සඳහා, විශේෂයෙන්ම සේවා නියුක්තියෙහි අඩු වීම බලපාන ලදී. ආහාර හා පාන සහ රෙදිපිළි හා නිමි ඇඳුම් යන අංශයන්හි නුපුහුණු සේවකයින් සේවය හැර යාමත් සමඟ, නවක සේවකයින් බඳවාගැනීමේ අපහසුතාවය මේ සඳහා බලපාන ලදී. තවද, 2018 ජූලි මාසයේදී නව ඇණවුම් සුළු වශයෙන් පහත වැටුණි. කෙසේ වුවද, ඉදිරි මාස තුන සඳහා රසායන ද්‍රව්‍ය හා ඖෂධ නිෂ්පාදන අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්හි අපේක්ෂිත වර්ධනය සමඟ, නිෂ්පාදන සහ ගැනුම් තොග වර්ධනය විය. මේ අතර, සාමාන්‍යයෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යාම තුළින් ආර්ථිකය වර්ධනය වන බව පිළිඹිබු වේ. එනමුත්, මෙම මාසයේ දී ලෝක වෙළඳපොළ තුළ අමුද්‍රව්‍ය හිඟ වීම සහ අයහපත් කාළගුණය හේතුවෙන්, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යන ලදී. එම නිසා, ආර්ථිකයේ වර්ධනයක් එමඟින් පිළිඹිබු නොවේ. සමස්තයක් ලෙස, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කල අතර, එමගින් 2018 ජූලි මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම්, 2018 ජුනි මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කෙරෙයි. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් බව පෙන්නුම් කරයි.

| | **ව\මා** | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | **2018** | 51.7 | 55.6 | 65.6 | 45.5 | 60.6 | 57.6 | **57.2** | - | - | - | - | - |

| **විචලයය** | **ජුනි** | **ජූලි** | **+/-** | **සාරාංශය** |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.6** | **57.2** | **-** | **අඩු වේගයකින්, ඉහළ** |
| | | **උප දර්ශක** | | |
| **නව ඇණවුම්** | 60.5 | 59.5 | - | අඩු වේගයකින්, ඉහළ |
| **නිෂ්පාදන** | 57.0 | 57.5 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **සේවා නියුක්තිය** | 58.5 | 55.0 | - | අඩු වේගයකින්, ඉහළ |
| **ගැනුම් තොගය** | 53.5 | 57.5 | + | වැඩි වේගයකින්, ඉහළ |
| **ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය** | 54.5 | 55.0 | + | වැඩි වේගයකින්, ඉහළ |

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## තෙවන කාර්තුව ආරම්භයේ දී සේවා අංශයෙහි වර්ධනය සුළු වශයෙන් පහළ යන ලදී

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2018 ජුනි මාසයේ දී වාර්තා වූ 58.7 ක දර්ශක අගයට සාපේක්ෂව 2018 ජූලි මාසයේ දී 57.8 ක දර්ශක අගයක් දක්වා පහළ යන ලදී. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ ඉහළ වර්ධනයෙහි දායකත්වයෙන් 2018 ජූලි මාසයේ දී අඩු වේගයකින් වුවද සේවා අංශය අඛණ්ඩව වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ රක්ෂණ යන අංශවල නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට හැකි විය. ප්‍රතිචාර දක්වන්නන් මෙම වර්ධනයට හේතු ලෙස ඩිජිටල් බැංකුකරණ ඒකක පිහිටුවීම සහ සේවා සැපයුම් මාර්ග වැඩිදියුණු වීම සඳහන් කර තිබුණි. පසුගිය මාස දෙක තුල රැකියා උත්පදනයෙහි සිදු වූ ඉහළ වර්ධනයට සාපේක්ෂව සේවා නියුක්තිය අඩු වේගයකින් වර්ධනය විය. සාමාන්‍යයෙන්, නිම කිරීමට ඇති කාර්යයන් පහළ යෑම තුළින් කෙටි කාලීනව ආර්ථිකය සංකෝචනය වන බව පිළිඹිබු වේ. කෙසේ වුවද, මෙම අවස්ථාවේ දී සේවා නියුක්තිය ඉහළ යෑම, නිම කිරීමට ඇති කාර්යයන් පහළ යෑමට හේතුවක් විය. එබැවින්, ආර්ථිකයෙහි සංකෝචනයක් එමඟින් පිළිඹිබු නොවේ. විශේෂයෙන්ම මූල්‍ය සේවා, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා, වෙනත් පෞද්ගලික සේවා සහ ප්‍රවාහන අංශවල සේවා සපයන්නන්ගේ ඉදිරි මාස 3 සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිලිබඳ සුබවාදී අපේක්ෂා වැඩි වේගයකින් වර්ධනය වූ අතර එය පසුගිය මාස 17 තුල වාර්තා කළ ඉහළම අගය වාර්තා කරන ලදී. මාසය තුල අනපේක්ෂිත මිල ඉහළ යෑම සිදු නොවීම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් අඩු වේගයකින් ඉහළ යන ලද අතර 2018 ජූලි මාසය දී එය පසුගිය මාස 3 තුල වාර්තා කළ පහළම අගය වාර්තා කරන ලදී. ජූලි මාසය තුල දී සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද අඩු වේගයකින් ඉහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | **2018** | 56.6 | 58.4 | 58.0 | 53.2 | 56.9 | 58.7 | **57.8** | - | - | - | - | - |

| විචල්‍යය | ජුනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **58.7** | **57.8** | **-** | **අඩු වේගයකින්, ඉහළ** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 58.8 | 59.9 | + | වැඩි වේගයකින්, ඉහළ |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 62.0 | 63.7 | + | වැඩි වේගයකින්, ඉහළ |
| සේවා නියුක්තිය | 58.8 | 51.1 | - | අඩු වේගයකින්, ඉහළ |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 46.1 | 42.9 | - | වැඩි වේගයකින්, පහළ |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 67.7 | 71.3 | + | වැඩි වේගයකින්, ඉහළ |




***තාක්ෂණික සටහන:***

### දර්ශකය

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

### නියැදිය

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

### විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.